

# ඉතිහාසය

## 13 ශ්‍රේණිය

දර්ශනපති
එෂාන් ඉමල්ක විජයරත්න

ගුරුගෙදර - උසස් පෙළ ඉතිහාසය
ජාතික අධ්‍යාපන ආයතනය

# 13.1 දහසය වැනි සියවසේ සිට දහ අට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව - 3


## මහනුවර රාජධානියේ සමාජ, ආර්ථික හා සංස්කෘතික රටාව

- මහනුවර රාජධානියේ සමාජ, ආර්ථික හා සංස්කෘතික රටාව පිළිබඳ තේමා 7ක් ඔස්සේ අවධානයට යොමුවීම

1. මහනුවර රාජධානියේ පාලන තන්ත්‍රය
2. මහනුවර රාජධානියේ ආර්ථික රටාව
3. මහනුවර රාජධානියේ සමාජ සංවිධානය
4. මහනුවර රාජධානියේ අධ්‍යාපනික තත්ත්වය
5. මහනුවර යුගයේ සාහිත්‍යය
6. මහනුවර රාජධානියේ කලාශිල්ප

# 13 ශ්‍රේණිය - ඉතිහාසය

## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව




**මහනුවර රාජධානියේ පාලන තන්ත්‍රය**

**උඩරට රාජ්‍යයේ පරිපාලන ව්‍යුහය**

- මහනුවර යුගයේ රාජාණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- රාජාණ්ඩු ක්‍රමය තුළ ක්‍රියාත්මක වූ පාලනය කොටස් 2කට බෙදා දැක්විය හැකි බව
  - මධ්‍යම පාලනය
  - ප්‍රාදේශීය පාලනය
  - උඩරට පරිපාලනයේ ඉහළට පුද්ගලයා රජ වීම

- රජු සතු බලතල හා කාර්යයන්
  - නීති පැනවීම
  - යුද්ධය හා සාමය පිළිබඳ තීරණ ගැනීම
  - මරණ දඬුවම පිළිබඳ තීරණ ගැනීම
  - රටේ සාමය පවත්වාගෙන යාම
  - රටවැසියාට ආරක්ෂාව සැලසීම
  - රටේ සියලු දේශපාලන, ආර්ථික, පරිපාලන කටයුතු රජුගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වීම

- උඩරට රාජ්‍ය උරුමය හිමිවීම
  - පියාගෙන් පුතාට
  - සහෝදරයාගෙන් සහෝදරයාට
  - රජුගෙන් මස්සිනාට
- රජුගේ බලය සීමා කළ සාධක
  - චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායට ගරු කිරීම
  - අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්
  - මහනායක හිමිවරුන්ගේ උපදෙස්
  - රදල නායකයන්ගේ බලපෑම්

# මධ්‍යම පාලනය

- රජුගේ ප්‍රධාන නිලධාරීන් අදිකාරම් හෙවත් මහ නිලමේලා දෙදෙනෙකු සිටීම
- පදවිවලට සම්බන්ධ ගම් අනුව අදිකාරම්වරු

    1. පල්ලේ ගම්පහේ මහ අදිකාරම
    2. උඩරට ගම්පහේ මහ අදිකාරම

- මහනුවර ආරක්ෂක භට හමුදාව අදිකාරම්වරුන් දෙදෙනා යටතේ පැවතීම
- අදිකාරම්වරු දෙදෙනාට අමතරව සියපත්තුවේ අදිකාරම් ලෙස තුන්වන අදිකාරම්වරයෙකු ද සිටීම

- ඒ ඒ අදිකාරම්වරු යටතේ පාලනය වූ ප්‍රදේශ

| <u>මහ අදිකාරම</u> | <u>දෙවන අදිකාරම</u> |
|---|---|
| හත් කෝරලේ | හතර කෝරලේය |
| ඌව | තුන් කෝරලය |
| මාතලේ | සබරගමුව |
| වලපනේ | ඌව පළාත |
| බින්තැන්න | උඩුනුවර, යටිනුවර, තුම්පනේ |
| නුවර කලාවිය | කොත්මලේ, බුලත්ගම |

- අදිකාරම්වරු යටතේ සේවයේ යෙදුනු පිරිස්

1. කටුපුල්ලේ හෙවත් පණිවුඩකාරයෝ
2. රැකවල්ලු හෙවත් හිරගෙයි මුරකාරයෝ
3. කසකාර හෙවත් කස පුපුරවන්නෝ

# මහවාසල හෙවත් මාලිගාව සතු නිලධාරීන්

- මහවාසල කාර්යාංශ භාරව නිලමේවරු හා මුහන්දිරම්වරු රාජකාරියේ යෙදීම

1. මහමොහොට්ටාල - ප්‍රධාන ලේකම්, මාලිගාවේ ලේඛකාධිකාරී
2. මහ ගබඩා නිලමේ - රාජකීය ගබඩා භාරකාර තැන
3. දියවඩන නිලමේ - උළුපැන්ගේ හෙවත් රාජකීය ස්නානාගාරය භාර
4. හළුවඩන නිලමේ - රාජකීය ඇඳුම් ආයිත්තම් පිළිබඳ නායකයා

5. බත්වඩන නිලමේ - වාහල මුළුතැන්ගෙයි නායකයා
6. අස්පන්තියේ මුහන්දිරම් නිලමේ - අස්පන්තියේ ප්‍රධානියා
7. කවිකාර මඩුවේ මුහන්දිරම් නිලමේ - රාජ සභා කවීන්ගේ නායකයා
8. ගජනායක නිලමේ - කුරුවේ හෙවත් ඇතුන්ගේ කටයුතු භාර ප්‍රධානියා

# ප්‍රාදේශීය පරිපාලනය

- උඩරට රාජ්‍යයේ ප්‍රාදේශීය බෙදීම් දෙකක් පැවතීම
  1. රට
  2. දිසාව

# රට

- රාජ්‍යයේ කේන්ද්‍රය වූ කන්ද උඩ පස් රට ප්‍රදේශය රටවල් 9කට බෙදා පැවතීම

1. උඩුනුවර
2. යටිනුවර
3. තුම්පනේ
4. හාරිස්පත්තුව
5. දුම්බර
6. හේවාහැට
7. කොත්මලේ
8. උඩබුලත්ගම
9. පාත බුලත්ගම

# රටේ රාලවරු

- රට ලෙස හැඳින්වූ ප්‍රදේශ භාර නිලධාරීන් රටේ රාල හෙවත් රටේ මහත්වරුන් බව
- රටේ රාලගේ සහයට ලියන රාල උණ්ඩිය රාල, කෝරාළ හා විදානේ නම් ගම් ප්‍රධානීන් සහාය වීම

# දිසාවක පරිපාලනය

- අගනුවරට දුර බැහැර පිහිටි ප්‍රාදේශීය පාලන ඒකක දිසා නම් වන බව
- දිසාවනි භාරව සිටි නිලධාරීන් දිසාව නම් ලෙස හැඳින්වීම
- මහ දිසා සහ සුළු දිසා වශයෙන් දිසාවනි දොළහක් පැවති බව

මහදිසා - සතර කෝරළේ - සත් කෝරළේ

ඌව මාතලේ

සුළු දිසා - සබරගමුව - තුන්කෝරළේ

වලපනේ - උඩපළාත

නුවර කලාවිය - වෙල්ලස්ස

බින්තැන්න - තමන් කඩුව

# දිසාවේවරු

- දිසාවනි භාරව සිටි නිලධාරීන් දිසාවේ හෙවත් දිසාපති බව
- දිසාවේවරුන්ගේ කාර්යයන් ලෙස යුක්තිය පසිඳලීම
- ආදායම් එකතු කිරීම, රජුට හිමි ශ්‍රම සේවා ලබා ගැනීම
- අදිකාරම්වරු දෙන ලද රජුගේ ආඥා ක්‍රියාත්මක කරවීම බව

- සෑම පළාතකම දිසාවේ පත් කළ නිලධාරීන් තිදෙනකු විය.
    1. දිසාවේ මොහොට්ටාල
    2. අතපත්තු මොහොට්ටාල
    3. කොඩිතුවක්කු මොහොට්ටාල
- දිසාවනියක් කෝරළවලටත්, කෝරළයක් පත්තුවලටත් බෙදා තිබීම
- කෝරළයක් භාර නිලධාරියා කෝරළ ය. ඔහුගේ රාජකාරිය ක ද රාජකාරිය හෙවත් ධාන්‍ය බද්ද එකතු කිරීම බව
- කෝරාළගේ සහයට අතුකෝරාළවරු වූ බව

- නිශ්චිත ප්‍රදේශය කොටසක විශේෂ කුලයක් භාරව මුහන්දිරම්ලා වූ බව
- මුහන්දිරම්වරු යටතේ එක ගමක වාසය කළ ඒ ඒ කුලය භාරව විදානේලා වූ බව

# බද්දෙ සංවිධානය

- රජයට ආදායම් හා සේවා ලබාදීමේ පරමාර්ථයෙන් ඒකක ලෙස සංවිධානය වූ කුල කණ්ඩායම් බද්ද ලෙස හැඳින්වෙන බව

- උඩරට රාජ්‍යයේ අවසාන කාලයේ දිසාවේ යටතේ ක්‍රියාත්මක වූ බද්ද සංවිධානයක් මෙසේය.

1. මඩිගෙ බද්ද හෙවත් ප්‍රවාහන කාර්යාංශය
2. කුරුවෙ බද්ද හෙවත් ඇතුන් පිළිබඳ කාර්යාංශය
3. බඩහැල බද්ද හෙවත් කුඹල් කාර්මික කාර්යාංශය
4. රදා බද්ද හෙවත් රජක (රෙදි සේදීම) කාර්යාංශය
5. හැඳ බද්ද හෙවත් රෙදි විවීමේ කාර්යාංශය
6. කොට්ටල් බද්ද හෙවත් කාර්මිකයන්ගේ කාර්යාංශය
7. කින්නර බද්ද හෙවත් පැදුරු විවීම පිළිබඳ කාර්යාංශය

# විහාර දේපළ පාලන කටයුතු

- සංඝරාජ පදවිය වැලිවිටියේ ශ්‍රී සරණංකර හිමියන්ට පුදන ලද බව
- විහාරාරාම පාලන කාර්යයන් මහනායක හා අනුනායක හිමිවරුන්ගේ මූලිකත්වයෙන් සිදුවීම
- භික්ෂුන් වහන්සේලා 1754 දී මහාවිහාරීය උපසම්පදාවෙන් පසු සියම් නිකාය ලෙස සංවිධානය වීම හා ග්‍රාමවාසී සම්ප්‍රදාය මුල් කරගත් මල්වතු පාර්ශ්වය හා වනවාසී සම්ප්‍රදාය මුල් කොට ගත් අස්ගිරි පාර්ශ්වය යන අංශ යටතේ වර්ධනය වීම

- දළදා මාලිගාවේ පාලනය, ආරක්ෂාව හා ආවතේව කටයුතු සඳහා දියවඩන නිලමේ පත් කළ බව
- මහනුවර විෂ්ණු, නාථ, පත්තිනි, කතරගම දේවාල හා වෙනත් දේවාල බස්නායක නිලමේවරුන් යටතේ පැවති බව

# අධිකරණය

- අධිකරණය පිළිබඳ උත්තරීතර බලය රජුට හිමිවීම සහ මරණ දඬුවම නියම කළ හැකි වූයේ රජුට පමණි.
- රජුගේ සිට විදානේ දක්වා සියලුම නිලධාරීන් අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම
- ප්‍රධාන පෙළේ නඩු විනිශ්චය කරන ලද්දේ රජු ඉදිරියේ ය. ඒවානම්,
    1. වැදගත් නායකයන් සම්බන්ධ නඩු
    2. කැරලි කෝලාහල පිළිබඳ නඩු
    3. කුමන්ත්‍රණ නඩු

4. රාජද්‍රෝහීත්වය පිළිබඳ නඩු
5. විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු

- රාජාධිකරණය ළඟට තිබූ වැදගත් විනිශ්චය මණ්ඩලය මහනඩුව හෙවත් මහ උසාවිය යි. එය අදිකාරම්වරු දෙදෙනෙකු, දිසාපතිවරු, රටේ රාලවරු හා ලේකම්වරු පස් දෙනෙකුගෙන් සමන්විත වීම
- දඬුවම් ක්‍රම වූයේ, ඇතුල් පහර දීම, දඬ ගැසීම, දඬු කඳේ ගැසීම, ඇතුන් ලවා පාගා මැරීම, කස පහර දීම, ඉපලෙන් තැලීම, දඟගෙයි ලෑම, පිටුවහල් කිරීම, රොඩී රැහැට දැමීම, හිසකෙස් කැපීම, දියේ ගිල්වා මැරීම ආදිය යි.

- මහනුවර යුගයේ ආගමික තත්ත්වය
- මහනුවර යුගයේ ආගමික තත්ත්වය තේමා 4ක් ඔස්සේ සාකච්ඡා කළ හැකි බව

1. බුදු දහම
2. හින්දු ආගම
3. කතෝලික ආගම
4. ඉස්ලාම් ආගම

# බුදුදහම


- 1 වන විමලධර්මසූරිය රජු විසින් බෞද්ධ පුනර්ජීවනය ආරම්භ කිරීම හා දළදා වහන්සේ උඩරටට වැඩම කරවීම
- රජු 1596 දී රක්ඛාංග දේශයට දූතයන් යවා භික්ෂූන් වැඩමවා මහනුවර ගැටඹේ දී උපසම්පදා විනය කර්මය සිදු කිරීම
- දෙවන විමලධර්මසූරිය රජු ද අරකන් දේශයට දූතයන් යවා භික්ෂූන් වඩමවා උපසම්පදා විනය කර්මය පිහිටුවීම

- 1753 දී සියම් දේශයෙන් භික්ෂුන් වැඩමවා උපසම්පදා කර්මය ඇති කිරීම හා සියම් නිකාය පිහිටුවීම
- වැලිවිට ශ්‍රී සරණංකර හිමි සිල්වත් සමාගම පිහිටුවා දිවයිනේ බෞද්ධ සිද්ධස්ථාන පිළිසකර කරවීමට මග පෙන්වා ආගමික හා අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කිරීම
- පැරණි සංඝරාජ ධූරය වැලිවිට සරණංකර හිමියන්ට පැවරීම
- මහනුවර නියමකන්ද විහාරස්ථානය පිරිවෙනක් බවට පත්කිරීම

- ගඩලාදෙණිය ධර්මතිලක විහාරය උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් කිරීම
- කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස මහනුවර ඇසල පෙරහැරට දළදා පෙරහැර ද එකතු කොට බෞද්ධ උත්සවයක් බවට පත්කිරීම
- ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දළදා මාලිගාවේ පත්තිරුප්පුව ඉදිකිරීම

13 ශ්‍රේණිය - ඉතිහාසය

දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



# හින්දු ආගම

- මහනුවර රාජ්‍යයේ නායක්කර් වංශය බලයට පත්වීමත් සමඟ හින්දු ආගම ව්‍යාප්ත වීම
- නායක්කර් වංශික රජුන් බුදුදහම වැළඳගෙන ඊට පක්ෂපාතී වුවත් පාරම්පරික ආගම වූ හින්දු ශෛවආගම අත් නොහළ බව
- නායක්කර්වරු මාලිගය අසලම බිසෝවරු හා ඥාතීන් සඳහා හින්දු දේවාල ඉදිකිරීම

- පන්සල් තුළ දේවාල ඉදිරිපිට හා දළදා පෙරහැරට සතර මහා දේවාල පෙරහැර එකතු වීම හින්දු ආගමික බලපෑමෙන් සිදු වූ බව

# කතෝලික ආගම

- දෝන කතිරිනා කුමරිය කුඩා කල සිටම කතෝලික බැතිමතියක වීම
- පහතරට ප්‍රදේශවල ලන්දේසීන් විසින් රෝමානු කතෝලික ආගම තහනම් කළ බැවින් එම ආගමික පූජකවරු හා කතෝලික බැතිමතුන් උඩරට ප්‍රදේශවලට පැමිණ පදිංචි වීම

- දෙවෙනි විමලධර්මසූරිය රජු දවස ජෝසප් වාස් පියතුමා උඩරට රෝමානු කතෝලිකයන්ගේ ආගමික අවශ්‍යතා ඉටු කිරීම
- මාතලේ වහකෝට්ටේ වැනි ප්‍රදේශවල කතෝලික ජනයාගේ විශේෂ වාසස්ථාන ඇතිවීම

# ඉස්ලාම් ආගම

- කෝට්ටේ අවධියේ එම රාජධානියට සංක්‍රමණය වී සිටි මුස්ලිම්වරු පිරිසක් පිටුවහල් කළ බැවින් ඔවුන් සෙනරත් රජු දවස උඩරටට පැමිණීම
- රොබට් නොක්ස්ගේ වාර්තාවේ ඉස්ලාම් දේවස්ථානයක් කන්දේ නුවර පිහිටි බව සඳහන් වීම
- පහත රටින් පලා ආ මුස්ලිම්වරු උඩරට රැකවරණ යටතේ පදිංචි වීමෙන් මුස්ලිම් ආගම ව්‍යාප්ත වීම

# උඩරට ආර්ථික රටාව

- පරිභෝජනය පදනම් කරගත් කෘෂිකාර්මික ආර්ථිකයක් පැවතීම හා වී ගොවිතැන ප්‍රධාන වගාව වීම
- කඳුකර ප්‍රදේශ බහුල වීම නිසා වර්ෂා ජලයෙන් හෙල්මළු ක්‍රමයට වී වගා කිරීම
- හේන් වගාවට වැඩි වැදගත්කමක් ලැබුනු අතර ධාන්‍ය වර්ග ඇතුළු බෝග රැසක් වගා කිරීම

## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව





එනම්,
තල, මෙනේරි, කුරහන්, කවුපි, මෑ වැනි ධාන්‍ය හා කැකිරි, පිපිඤ්ඤා වැනි එළවළු වර්ග ද වගා කර තිබීම

- උඩරට සත්ත්ව පාලනය ද පැවති අතර එළ ගවයන් සහ මී ගවයන් ඇති කිරීම

- උඩරට වෙළඳාම කොටස් 2 කි.
  1. දේශීය වෙළෙඳාම
  2. විදේශීය වෙළෙඳාම
- දේශීය නැතහොත් අභ්‍යන්තර වෙළෙඳාම භාණ්ඩ හුවමාරුව මගින් ද, සුළු වශයෙන් මුදල් හුවමාරුව මගින් ද සිදු කිරීම
- උඩරට ගම් එකිනෙක සම්බන්ධ කළ අඩි පාරවල් අසල රෙදිපිළි, ලුනු, දුම්කොළ, හුනු, වළං, බෙහෙත් ද්‍රව්‍ය, ලෝහ භාණ්ඩ ආදිය අලෙවි කළ කුඩා කඩපිල් තිබූ බව රොබට් නොක්ස් සඳහන් කිරීම

- විදේශ වෙළෙඳාමේ අතරමැදියන් ලෙස මුස්ලිම්වරු ක්‍රියා කිරීම
- ඉන්දියාව, පෘතුගාලය, ඕලන්දය වැනි රටවල් සමඟ විදේශ වෙළෙඳාම වැඩි වශයෙන් සිදු කිරීම
- අලි, ඇතුන්, ඇත් දළ, මුතු, මැණික්, කුරුඳු, පුවක් හා කුළුබඩු වර්ග ආදිය ප්‍රධාන අපනයන භාණ්ඩ ලෙස වැදගත් වීම
- උඩරට පාලකයන් වෙළෙඳ කාර්යයන් සඳහා කල්පිටිය, කොට්ටියාරම වැනි වරායන් බහුලව භාවිත කිරීම

# උඩරට සමාජ සංවිධානය

- රටේ සියලු ඉඩම්වල උරුමකරු රජු ලෙස පිළිගැනීම
- රටේ මුළු ඉඩම් ප්‍රමාණය අයිතිය හා භුක්තිය පදනම් කරගෙන කොටස් 5කට බෙදීම

1. ගබඩාගම්
2. නින්දගම්
3. විහාරගම්
4. දේවාලගම්
5. පරවේණිගම්

- රජයේ ඉඩම්, රජ වාසලේ ප්‍රයෝජනයට වෙන් කළ ඉඩම් ගබඩාගම් නම් වීම හා බිසවට අයත් වූ ගම් බිසෝගම් වීම
- පුද්ගලයන්ට පවරා දුන් සමහර රාජකීය ඉඩම් නැතහොත් රදල ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රධානය කළ ඉඩම් නින්දගම් නම් විය.
- බෞද්ධ සිද්ධස්ථානවලට අයත් වූ පූජනීය ඉඩම් විහාරගම් නම් විය.
- විෂ්ණු, කතරගම හා පත්තිනි වැනි දේවාල සතු පූජනීය ඉඩම් දේවාලගම් නම් විය

- ගම්වැසියන් පරම්පරාගතව භුක්ති විඳි ඉඩම් පරවේණිගම් නම් විය.
- රජුගේ ඉඩම් භුක්ති විඳින ලද රටවැසියන් ඒ වෙනුවෙන් රජුට විවිධ සේවා සපයන ලද අතර රජුගෙන් ඉඩම් ලබාගත් නිලධාරීන් ඒවා වගා කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත බෙදාදීම
- ඉඩම් භුක්ති විඳි ඔවුන් රජයට සහ ප්‍රභූවරුන්ට කිසියම් සේවාවක් හෝ නියමිත භාණ්ඩ ප්‍රමාණයක් සැපයීම
- ඉඩම් අයිතිය හා භුක්තිය සමඟ බැඳී ඇති එම ක්‍රමය ඉඩම් භුක්ති රාජකාරී ක්‍රමය නම් වේ

# උඩරට ගැමි සමාජය

- එක් ඉඩමක් පංගුව හෙවත් වසම නම් වන අතර එක් ස්ථානයක පිහිටි ඉඩම් පංගු රැසක් ගම නම් වේ.
- පවුල සමාජයේ ප්‍රධානතම ඒකකය වූ අතර සමාජයේ එකිනෙකා අතර පැවති සහයෝගය මත උඩරට ස්වයංපෝෂිත ගැමි සමාජයක් ගොඩනැගී තිබීම
- උඩරට සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පනදම් වීම
- කුල ස්තරායනය යනු සමාජ අසමානතාවයෙන් යුක්ත පද්ධතියක් වන අතර එමගින් මිනිසුන්ගේ සමාජ තත්ත්වය ඔවුන්ගේ දෙමාපියන්ගෙන් ආරෝපිත වන සමාජ තත්ත්වය අනුව ස්ථිරව තීරණය කරනු ලබයි

- උඩරට කුල ස්තරායනය සහ ඒ ඒ කුලයන්ට වෙන් වූ ආර්ථික කටයුතු

- ගොවිගම

  රදළ - ඉඩම් හිමි ප්‍රධානීන්
  ගොවි - ගොවිතැන්වල නිරත වූ ඉඩම් හිමි පිරිස්
  පට්ටි - ගව පාලනයේ නියුතු වූවන්

- හුනු - අලුහුනු කර්මාන්තයේ නියුතු වූවන්

- ආචාරි - රන්, රිදී, පිත්තල කර්මාන්තයේ නියුතු වූවන්

- නවන්දන්න /ගල්ලදු - කම්මල් වැඩවල නියුතු වූවන්
- හේන/රදා - රෙදි සේදීමේ නියුතු වූවන්
- වහුම්පුර/හකුරු - හකුරු සෑදීමේ නියුතු වූවන්
- කුඹල්/බඩහැල - වළං සෑදීමේ නියුතු වූවන්
- පන්න - බටපොතු කර්මාන්තය / ඇත්ගොව්වන්
- නැකති/බෙරවා - බෙරගැසීම, නැටුම් හා නක්ෂත්‍ර වැඩවල නියුතු වූවන්

- බත්ගම - කුලී වැඩ / ගෘහසේවකයන්
- කින්නර - පැදුරු විවීමේ නියුතු වූවන්
- රොඩී - සිඟාකෑමේ නියුතු වූවන්

# උඩරට අධ්‍යාපනය

- මහනුවර යුගයේ පැවති ව්‍යාකූල දේශපාලන තත්ත්වය නිසා මුල් යුගයේ අධ්‍යාපනයේ පසුබෑමක් පැවතීම
- කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය යටතේ වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ ශිෂ්‍ය භික්ෂුන් රාජ්‍ය පුරා අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කිරීම
- සරණංකර හිමි සාරාර්ථ සංග්‍රහය, භේසජ්ජමඤ්ජුසා සන්නය, සංඝරාජ සාධු චරියාව, ශ්‍යාමෝප සම්පදාවත රචනා කිරීම

- අධ්‍යාපන කාර්යයන්ට නම් පොත, මගුල්ලකුණ, වදන් කවිපොත, ගණදෙවි හැල්ල, බුද්ධගද්‍ය, නාමාෂ්ටක ශතකය, අනුරුද්ධ ශතකය, සූර්ය ශතකය වැනි කෘති භාවිත කිරීම
- පන්සල පදනම් කරගත් අධ්‍යාපන ආයතන රැසක් දියුණු වීම එනම්, අස්ගිරිය, ගංගාරාමය, සුදුහුම්පොළ, අම්පිටිය, නිත්තවෙල, පෝයමළු විහාරය, ඇම්බැක්කේ අසල නියමකන්ද පිරිවෙන ආදිය

# මහනුවර යුගයේ සාහිත්‍ය

- වියත් භික්ෂූන් වහන්සේලා මේ යුගයේ දී සාහිත්‍ය ග්‍රන්ථ රැසක් රචනා කිරීම
- වැලිවිට සරණංකර හිමි තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමි, කරතොට ධම්මාරාම හිමි, සිටිනාමළුවේ ධම්මජෝති හිමි, වැනි වියත් භික්ෂූන් සාහිත්‍ය ප්‍රබෝධයක් සඳහා මුල පිරීම
- භික්ෂූන් වහන්සේ වෙතින් භාෂා ශාස්ත්‍ර ප්‍රගුණ කළ රාජාධි රාජසිංහ වැනි පාලකයන් ග්‍රන්ථකරණයේ නිරත වීම

- **විවිධත්වයකින් යුතු සාහිත්‍යයක් බිහිවීම**

| | | |
|---|---|---|
| ප්‍රශස්ති කාව්‍ය | - | රාජසිංහ වර්ණනා, ඉංග්‍රීසි හටන, රාජසිංහ හටන |
| කවි කතා | - | වෙස්සන්තර ජාතකය, දේවධර්ම ජාතකය, සුමුගුදාකව, තෙරුවන් මාලා, මුතුකුමාරි කතාව |
| වෙනත් කෘති | - | භේසජ්ජ මඤ්ජුසාසන්නය, සතර බණවර සන්නය, සද්ධර්මවාද සංග්‍රහය, පත්තිනි හෑල්ල, ගණදෙවි |

හැල්ල, බාලාවතාර සංග්‍රහ, සර්වඥගුණාලංකාරය, ශ්‍රී සද්ධර්මවාද සංග්‍රහය, විශෝමග රත්නමාලය

- වැලිවිට සරණංකර හිමිගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට අයත් දික්වැල්ලේ ශ්‍රී බුද්ධරක්ඛිත හිමි, භරණ ගණිතය, සාලි ඇලේ වනරතන හිමි වැනි උගතුන් ග්‍රන්ථකරණයේ නියැළීම

- කුරුණෑගල රිදී විහාරය මුල්කරගෙන ධර්ම ශාස්ත්‍රීය කටයුතු කළ තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමි සමකාලීන සමය තෙක් මහාවංස කාණ්ඩය රචනා කිරීම
- උඩරටින් ඇරඹි ශාස්ත්‍ර ප්‍රබෝධය දකුණුලක කරා ඇදී යාමෙන් මාතර සාහිත්‍ය ආරම්භ වීම

# කලාශිල්ප

- ලී, ගල්, ඇත්දත්, තඹ, පිත්තල, රන්, රිදී, ආදී මාධ්‍යවලින් නිම කළ කලා නිර්මාණ මේ යුගයේ දක්නට ලැබීම
- මෙම කලා නිර්මාණ මහනුවර දළදාමාලිගාව, රිදී විහාරය, ඇම්බැක්කේ දේවාලය, සූරියගොඩ විහාරය, ලේවැල්ල ගංගාරාමය, දෙගල්දෝරුව විහාරය, මැදවෙල් විහාරය වැනි ස්ථානවල් ශේෂ වී තිබීම

# 13 ශ්‍රේණිය - ඉතිහාසය
## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



13 ශ්‍රේණිය - ඉතිහාසය

දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



# මහනුවර යුගයේ සිතුවම් කලාව

- අඛණ්ඩ කථන සම්ප්‍රදාය නිරූපණය වන සිතුවම් නිර්මාණ
- මහනුවර දළදා මැදුරේ සිතුවම් ගංගාරාමය සහ දෙගල්දොරුව යන ස්ථානවල මේ යුගයේ පැරණිතම සිතුවම් දක්නට ලැබීම
- මෙම සිතුවම්වල ගුත්තිල, විදුර, උම්මග්ග, ධර්මපාල, ඡද්දන්ත, දහම්සොඬ වැනි ජාතක කතා නිරූපණය කර තිබීම

- ගඩලාදෙණිය, ලංකාතිලක විහාරය, සූරියගොඩ විහාරය, මැදවල විහාරය, වැනි මහනුවර යුගයට වඩා පැරණි නිර්මාණවල ද මහනුවර යුගයේ සිතුවම් ඇඳ තිබීම



# 13 ශ්‍රේණිය - ඉතිහාසය
## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



13 ශ්‍රේණිය - ඉතිහාසය

දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



# 13 ශ්‍රේණිය - ඉතිහාසය
## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



- නායක්කර් රජවරුන් විසින් අනුග්‍රහ දක්වා ගොඩනගන ලද විහාරස්ථාන රැසක බෞද්ධ සිතුවම් නිර්මාණය වී තිබීම
- මෙම සිතුවම් ශෛලීගත විලාශයකට නිර්මාණය කර තිබීම
- මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර කලාව මීට පෙර යුගයේ දිවයිනේ පැවති පැරණි ශ්‍රී ලාංකික සිතුවම් කලාවේ බලපෑමෙන් ප්‍රභවය වී ඇති බව
- විවිධ ශාකවර්ග, පාෂාණ වර්ග, මැලියම් වර්ග, යොදා ගනිමින් සකස් කළ සුදු, කළු, කහ, රතු වැනි වර්ණ චිත්‍ර ඇඳීමට භාවිත කිරීම

# සාරාංශය

1. මහනුවර රාජධානියේ පාලන තන්ත්‍රය
2. මහනුවර රාජධානියේ ආර්ථික රටාව
3. මහනුවර රාජධානියේ සමාජ සංවිධානය
4. මහනුවර රාජධානියේ අධ්‍යාපනික තත්ත්වය
5. මහනුවර යුගයේ සාහිත්‍යය
6. මහනුවර රාජධානියේ කලාශිල්ප